ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ක්‍රිස්තු ධර්මය - I | කාලය පැය එකයි. |
|---|---|---|

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න
- 01 සිට 40 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපසින් දැක්වෙන උපදෙස් පරිදි (×) යොදා දක්වන්න
- වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න

---

(01). ජේසුස් වහන්සේගේ පෙළපත වන්නේ,
(i). දාවිත්ගේ පෙළපත (ii). ආබ්‍රහම්ගේ පෙළපත
(iii). සාවුල්ගේ පෙළපත (iv). බෙන්ජමින්ගේ පෙළපත

(02). ගාබ්‍රියෙල් දේව දූතයා විසින් ම මෙම උපත් දෙක පිළිබඳව මරියතුමියටත් සෙකරියස් පූජකතුමාටත් සැලකිරීමෙන් අවධාරණය වන්නේ,
(i) මෙම උපත් දෙකම ආශිර්වාද ලත් සුබ හසුන් දෙක බව
(ii) මෙය රහසිගතව සිදුවූවක් බව
(iii) මනුෂ්‍ය විවේචනයට බඳුන්වීම
(iv) මෙහි විශේෂත්වයක් නොවීම

(03). පලස්තීනයේ සිටි ජුදා ජනතාව රෝම අධිරාජ්‍යාට යටත්ව සිටි නිසා,
(i). ආගමික වශයෙන් මහත් පීඩාවට ලක්විය
(ii). ආර්ථික වශයෙන් පීඩාවට ලක්විය
(iii). දේශපාලනික වශයෙන් පීඩාවට ලක්විය
(iv). සමාජීය වශයෙන් පීඩාවට ලක්විය

(04). චර්මඡේදන පිළිවෙතේ සම්බන්ධය වන්නේ,
(i). නික්මයාම සිද්ධිය හා සම්බන්ධ වේ
(ii). පාස්කු සිද්ධිය හා සම්බන්ධයි
(iii). පෙන්තකොස්ත සිද්ධිය හා සම්බන්ධ වේ
(iv). මහා බ්‍රහස්පතින්දා හා සම්බන්ධ වේ

(05). "කිසිවෙකුගෙන් බලහත්කාරයෙන් කිසිවක් පැහැර නොගන්න. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න." ස්නාවක ජොහාන් විසින් මෙය පවසන ලද්දේ,
(i). පොදු ජනතාවට (ii). රාජ්‍ය සේවයේ යෙදී සිටි අයට
(iii). ආරක්ෂක අංශයට (iv). ජුදා ආගමික ජනතාවට

(06). "කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත්, ධාන්‍ය පොළා සිය අටුවේ රැස් කරන පිණිසත් උන් වහන්සේ අතේ කුල්ල ඇත. එහෙත් බොල් නොනිමෙන ගින්නෙහි දවාලනු ලැබේ." මෙහි අර්ථය වන්නේ,
(i). දේව විනිශ්චයේ ස්වභාවය (ii). වී අස්වැන්නේ ස්වභාවය
(iii). මිනිස් ජීවිතයේ ස්වභාවය (iv). දෙවියන් වහන්සේගේ ස්වභාවය

(07). ව්‍යවස්ථාවේ හරය වන්නේ කුමක් ද?
(i). ප්‍රේමය (ii). බලාපොරොත්තුව (iii). ඇදහිල්ල (iv). විශ්වාසය

(08). යහපත් එඬේරා තුළ පවතින නායකත්වයේ ගුණාංග පිළිපදින ඔබ තුළ තිබිය යුතු ගුණාංගයක් නම් කරන්න.
(i). කැප කිරීමෙන් හා සහයෝගයෙන් ජීවත්වීම (ii). බැහැපත් කමින් ජීවත්වීම

www.edudept.up.gov.lk

(iii). දයාව තුළ ජීවත්වීම (iv). වගකීම් තුළ ජීවත්වීම

(09). නාසරෙත් හි ජේසුතුමන්ගේ දේශනාව අසා සිටි අය උන්වහන්සේ ගැන පැවසුවේ,
(i). දාවිත් රජු ලෙස (ii). දිවැසිවරයකු ලෙස
(iii). ජොහාන්ගේ පුතා ලෙස (iv). ක්‍රිස්තුවරයා ලෙස

(10). ජේසුස් වහන්සේගේ ප්‍රථම ගෝලයන් දෙදෙනා වන්නේ,
(i). පේදුරු හා ජොහාන් (ii). පේදුරු හා ඇන්ඩෘ
(iii). ජාකොබ් හා ජොහාන් (iv). පිලිප් හා පේදුරු

(11). ජෝබ්ගේ කතාවෙන් ගත හැකි ආදර්ශයක් වන්නේ,
(i). පව්කාරකම බාරගැනීම
(ii). දුකේදී දෙවියන්ට තුතිදීම
(iii). ලෝකයේ දේ පිළිබඳ අවධානය යොමු කිරීම
(v) සියළු වැරදි දෙවියන් වෙතින් සිදු වූ බව දෝෂාරෝපණය කිරීම

(12). ජේසුස් වහන්සේ දුන් නව ආඥාව වන්නේ,
(i). නුඹේ සතුරන්ට ප්‍රේම කරන්න
(ii). හිංසා කරන්නන්ට සමාව දීම
(iii). මා නුඹට ප්‍රේම කලාක්මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරන්න
(iv). ඔබට හිංසා කරන්නන්ට ආසිරි පතන්න

(13). මෙසියස්වරයාණන්ගේ සදාකාලික දේව රාජ්‍යයේ සවිමත් පදනම වන්නේ,
(i). සාමය හා යුක්තියය (ii). යුක්තිය හා ධර්මිෂ්ඨකමය
(iii). සාමය හා ධර්මිෂ්ඨකමය (iv). යුක්තිය හා සාධාරණත්වය

(14). ජුදෙව් ජනතාව ජේසුස් වහන්සේගෙන් බලාපොරොත්තු වූයේ,
(i). දෙවිකෙනෙක්ගේ භූමිකාව (ii). ඉන්ද්‍ර ජාලිකයකුගේ භූමිකාව
(iii). දේශපාලනික හා රාජකීය භූමිකාව (iv). පූජක භූමිකාව

(15). ජේසුස් වහන්සේගේ මෙලොව සේවය කැටිකර පෙන්වන දිවැසිවර ග්‍රන්ථය වන්නේ,
(i). මිකා (ii). එසකියෙල්
(iii). ජෙරමියා (iv). යෙසායා

(16). "ජෙරුසලමේ දූවරුණි මා නිසා නොහඬන්න. ඔබ හා ඔබේ දරුවන් නිසා ම හඬන්න." මෙහි ඉරි ඇඳි පදයෙන් දක්වන අර්ථය වන්නේ,
(i). උන්වහන්සේගේ කුරුසි පත්වීම පරාජයක් නොව විජයග්‍රහණයක් බව
(ii). දැන් ජේසුස් වහන්සේ වෙනුවෙන් ඇඬීම ව්‍යර්ථ බව ප්‍රකට කිරීම
(iii). අපව ද මරණයට කැඳවා ඇති බව පැවසීමක්
(iv). අපට ස්වර්ගයට යෑමට නොහැකි බව දැනුම්දීමකි

(17). දේව කැමැත්තට යටත්වන අයට කිතුණු ජීවිතය සඳහා ලැබෙන වඩාත්ම යහපත් ප්‍රතිවිපාකය නම්,
(i). සමාජයේ ඉදිරියේ නම්බුනාම දෙමින් පිළිගැනීමය
(ii). සතුරු උවදුරු වලින් ආරක්ෂාව ලැබීමයි
(iii). දුක් වේදනා විඳ ගනිමින් ප්‍රීතියෙන් ජීවත්වීමට දේව ශක්තිය ලැබීමය
(iv). කිසි දිනෙක රෝහල් ගත නොවීමය

(18). රෝම අධිකරණයට ඉදිරියේ පාවුල්ට ඉදිරිපත් වූ චෝදනාවක් නොවන්නේ,
(i). ව්‍යවස්ථාවට විරුද්ධව දෙවියන් වහන්සේට නමස්කාර කරන්නෙක්
(ii). ජුදෙව්වන් අතර කැරළි උපදවන්නෙක්
(iii). නාසරිය නිකායේ කැරළිකරුවෙක්
(iv). දේව මාලිගාව කෙළසන්නෙක්

(19). ස්නාවක ජොහාන් හා ජේසුස් වහන්සේගේ ද පෞද්ගලික යාච්ඤාවට හා භාවනාවට වඩාත් සුදුසු ස්ථානයක් ලෙස තෝරා ගත්තේ,

www.edudept.np.gov.lk

(i). ජෙරුසලම දේව මාලිගාව (ii). සිනගෝගය
(iii). පාළුකරය (iv). මුහුදු වෙරළ

(20). දේව රාජ්‍යය වෙනුවෙන් කඳුළු සලන අයට ආරක්ෂා කළ හැකි භාග්‍යය වන්නේ,
(i). සිනාසීමට ඇති හැකියාවයි
(ii). පුෂ්ටිමත් ජීවිත ගත කිරීමට ඇති හැකියාවයි
(iii). කුසගින්න නිවා ගැනීමට ඇති හැකියාවයි
(iv). සියලු රෝග වලින් සුවය ලබා ගැනීමට ඇති හැකියාවයි

(21). "නුඹේ දෙවිවන ස්වාමීන්වහන්සේට පමණක් නමස්කාර කරන්න" ඔබ මෙම ජේසුස්වහන්සේගේ ප්‍රකාශනය විශේෂයෙන් පිළිපැදිය යුත්තේ,
(i). කීර්තිය , වස්තුව , බලය පසු පස යන සමාජ රැල්ලට හසුනොවන පිණිසයි
(ii). විවිධ විලාසිතාවන්ගෙන් වැළකෙන පිණිසයි
(iii). වැරදි ආදර්ශ දෙන්නන්ගෙන් මුලා නොවන පිණිසයි
(iv). නපුරේ බලයට මුළුමනින්ම එරෙහි වන පිණිසයි

(22). ජේසුස් වහන්සේ ගෙත්සෙමනේදී ආධ්‍යාත්මික පොර බැදීමෙන් ජයගත් බවට ප්‍රධාන සාක්ෂිය වන්නේ,
(i). තමා පාවා දුන් ජුදස් අනුකම්පා සහගතව පිළිගැනීමයි
(ii). තමා අත් අඩංගුවට ගැනීමට පැමිණි අයට එඩිතරව මුහුණ දීමයි
(iii). තමකම සම්පූර්ණයෙන්ම නසා දමා දේව කැමැත්තට අවනතවීමයි
(iv). මෙවන් අවස්ථාවලදී පවා ශ්‍රාවකයන් පිළිබඳ අවබෝධයෙන් සිටීමයි

(23). "ස්ථිර කිතුණු පවුලක් තුළ තිබිය යුතු විශේෂත්වය වන්නේ,
(i). අන්‍යෝන්‍ය ප්‍රේමය මත වගකීම් බෙදා ගැනීමේ ගුණාංගයයි
(ii). දෙමව්පියන් දරුවන් වෙනුවෙන් දක්වන දැඩි පාලනයයි
(iii). සියලු දෙනා මුදල් ඉපයීමට දරණ වෑයමයි
(iv). දේව වචනය වාචිකව ප්‍රකාශ කිරීමයි

(24). මෙම රූපය තුළින් අපට ලබා දෙන අභියෝගය වන්නේ,
(i). අප සන්තක සියල්ල දේව සේවය සඳහා කැප කිරීමයි
(ii). සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන්වහන්සේටත් දීමයි
(iii). දේව සේවය සඳහා පිටත්ව යෑමේ දී හිස් අතින් යාමයි.
(iv). අභිමානයක් ඇති කර ගැනීමේ අරමුණින් දන් දීම



(25). පේදුරුගේ අපලාපය ගැන කලින් පවසමින් ජේසුස් වහන්සේ ඔහුට භාර කළේ,
(i). පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න
(ii). යළිත් හැරුණු පසු සහෝදරයින් ධෛර්යමත් කිරීමට
(iii). කිතුණු සභාව පිහිටුවීමේ වගකීම
(iv). ඔහුගේ සැබෑ පෞරුෂත්වය විමසීමේ වගකීමයි

(26). නාසරෙත් හි සිනගෝගයේ රැස් වූ ජනයා,
A - ජේසුස් වහන්සේ පාවා දුන්හ B - ජේසුස් වහන්සේ පරීක්ෂා කළහ
C - ජේසුස් ඉගැන්වීම ගැන මවිත වූහ D - ජේසුස් ප්‍රතික්ෂේප කළහ

(i) A, B (ii). B , C (iii). C , D (iv). A , D

(27). කිතුණු පවුලක ස්ථාවරත්වය පවත්වා ගැනීමට අවශ්‍ය සාධකය නම්,
A - එහි සාමාජියන්ගේ අන්‍යෝන්‍ය සබඳතා ගොඩනගා ගැනීම
B - එහි ආර්ථික තත්වය යහපත් කර ගැනීමය
C - දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කර ගැනීමය
D - දිනපතා යාච්ඤාවෙන් දේව අනුග්‍රහය ලබා ගැනීමය
මින් වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ,
(i). A, B (ii). A, D (iii). B, C (iv). C, D

(28). පහත දැක්වෙන්නේ ජීවිත ගමනේ දී මුහුණදීමට සිදුවන කුණාටු ය
- රැකියාව නැතිවීම
- අසාධ්‍ය රෝග වැළදීම
- ආගමික පීඩන
- පවුල් ප්‍රශ්න

www.edudept.up.gov.lk

මේවා අභියස කළ යුත්තේ,

(i) දෙවිඳුන්ගෙන් ප්‍රශ්න නැගීම (ii). දේව මග පෙන්වීම අනුව ක්‍රියා කිරීම
(iii). දෙවිඳුන්ට මොර ගැසීමය (iv). දේව මැදිහත්වීම බලාගෙන නිසොල්මන්වීමය

(29). පාවුලුතුමා සිර ගෙදර සිටින විට ඔහුට කරුණාව දැක්වූයේ,
(i). සොල්දාදුවා (ii). සීසර් (iii). ආණ්ඩුකාරවරයා (iv). මුලාදෑනියා

(30). මුල් කිතුණු සභාවේ ලක්ෂණයක් වන්නේ,
(i). හිංසාවෙන් බේරි හැංගි ජීවත්වීම
(ii). කිතුණුකම තුළ අභියෝගවලට මුහුණදීම
(iii). අන් අය විනිශ්චය කිරීම
(iv). දඬුවම් නියම කිරීම

(31). එම්මාවුස් ගමට ගිය ශ්‍රාවකයින් දෙදෙනා ඔවුන් ඇසින් දුටු සාක්ෂිය ඉදිරිපත් කළේ,
(i). "අපට ස්වාමින් වහන්සේ හමු වූ සේක" යනුවෙනි
(ii). "ඒකාන්තයෙන්ම ස්වාමීන් වහන්සේ නැගිට සිටින සේක" යනුවෙනි
(iii). "ස්වාමීන් වහන්සේ අප සමඟ ගමන් කළ සේක " යනුවෙනි
(iv). "උත්ථාන වූ ස්වාමින් වහන්සේ අපට කතා කළ සේක"යනුවෙනි

(32). ජේසුස් වහන්සේ පොන්තියුස් පිලාත් ආණ්ඩුකාරවරයාගේ විනිශ්චය සඳහා ගෙන යනු ලැබුවේ,
(i). මරණීය දණ්ඩනය නියම කළ යුත්තේ ආණ්ඩුකාරවරයා නිසා
(ii). ආණ්ඩුකාරවරයා අධිරාජ්‍යයාගේ නියෝජිතයා වූ නිසා
(iii). පලස්තීනය රෝමයට යටත්ව තිබුණු නිසා
(iv). සැන්හෙඩ්‍රින් සභාවට මරණීය දණ්ඩනය නියම කිරීමට බලය නොතිබුණු නිසා

(33). පාවුලුතුමාගේ දෙවන ධර්මදූත කණ්ඩායමට ලූක්තුමා එක්වූයේ,
(i). ලුස්ත්‍රාවේ දී (ii). ත්‍රෝයසේ දී (iii). එපීසියේ දී (iv). පිලිප්පියේ දී

(34). ජෙරමියා දිවැසිවරයා ප්‍රකාශ කළ විශේෂ පණිවිඩය වන්නේ,
(i). ජුදා ජනතාව බැබිලෝනියෙන් රැගෙන යන බව
(ii). ජුදා ජනතාව මිසරයෙන් රැගෙන යන බව
(iii). ජුදා ජනතාව ඊශ්‍රාලයෙන් රැගෙන යන බව
(iv). ජුදා ජනතාව බැබිලෝනියේ දී විනාශ වන බව

(35). පාවුලුත්මා ප්‍රධාන කථකයා වූ බැවින් ඔහුට "හෙර්මීස්" කියා නම් තැබුවේ ධර්මදූත සේවයේ කිනම් ස්ථානයක දී ද?
(i). එපිසියේ දී (ii). පිලිප්පියේ දී (iii). ලුක්ත්‍රාවේ දී (iv). ත්‍රෝවසයේ දී

(36). රූප විපර්යාසයේ දී ජේසුස් වහන්සේ පිළිබඳව දේව ප්‍රකාශනයෙන් තහවුරු වූ සත්‍යතා තුනට අයත් නොවන්නේ,
(i). දේව පුත්‍රභාවය තහවුරු වීම
(ii). දෙවිදාණෝ තෝරා ගත් තැනැත්තා බව තහවුරුවීම
(iii). උන්වහන්සේට සවන් දිය යුතු බව තහවුරුවීම
(iv). ජේසුස් වහන්සේ දිවැසිවරයෙකු බව තහවුරුවීම

(37). දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා විවෘත වන අවස්ථා මඟ හැරීමේ ප්‍රතිවිපාකය වනුයේ,
(i). වටිනා දෙයක් තෝරා නොගැනීමෙන් පසුතැවිලිවීමය
(ii). දායකවීම සඳහා නැවත අවස්ථා විවර නොවීමය
(iii). දේව වරප්‍රසාදවලට කැමැත්තෙන් පිටුපෑමය
(iv). පවතින වටිනා දෙයට වඩා කාලීන දෙයකට මුල් තැන දීමය

(38). දේව රාජ්‍යය යනු,
(i). මරණින් පසු හිමිවන්නකි (ii). අප තුළ මෙන්ම අප අතර පවතින්නකි
(iii). කිතුණුවන්ට පමණක් උරුමවන්නකි (iv). ජෙරුසලම පුරා පවතින්නකි

- **39 – 40 ප්‍රශ්න සඳහා පහත A B C D අදාළව පිළිතුරු සපයන්න.**

A යෙසායා B ආමොස් C ජෙරමියා D මිකා

www.edudept.up.gov.lk

(39). “ තමා අපවිත්‍ර තොල් ඇති සෙනඟක් අතරේ ජීවත්වන අපවිත්‍ර තොල් ඇති මිනිසෙක් බව.” ප්‍රකාශ කළේ,
(i). A (ii). B (iii). C (iv). D

(40). සමාජයේ ජීවත් වූ ධනපතින්ගේ භාර්යාවන් ‘‘තරබාරු එළදෙනෙකු’’ ලෙස හැඳින් වූයේ,
(i). A (ii). B (iii). C (v). D (1×40= 40)

www.edudept.up.gov.lk